# <u>සිංහල භාෂාව හා සාහිත්‍ය - 7 ශ්‍රේණිය</u>

ශිෂ්‍ය උපකාරක අත්වැල

**බලංගොඩ අධ්‍යාපන කලාපය**

| | විෂය | වාරය | ඒකකය |
|---|---|---|---|
| 7 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍ය | පළමු වාරය | (2 වන පාඩම) සසුන බැබළවූ සරණංකර සඟරජ තෙරණුවෝ |


වයි.වී.ජී. කේ. සේනාරත්න මෙය.

ර/බල/කෝන්ගහමංකඩ විද්‍යාලය.


**ආයුබෝවන් ආදරණීය දූවේ පුතේ, අපි අද මහනුවර යුගයේ ලස්සන කතාවක් කියවමු නේද,**



**"දරුවනේ ,අපේ රටේ මහනුවර පළාතට අයිති වෙන තුම්පනේ නම් ප්‍රදේශයේ තිබුණා හරි අපූරු ගම්මානයක්. ඒ ගමේ නම වැලිවිට. ඒ ගමේ ඉපදුනා හරි අපූරු ළමයෙක්. ඔහු නමින් කුලතුංග බණ්ඩා. මෙම දරුවා ආගමට මෙන්ම අධ්‍යාපනයට කුඩා කල සිටම ගොඩාක් කැමතියි. එම නිසා මේ දරුවාට මූලික අධ්‍යාපනය ලබා දීමට එරමුදු ලියද්දේ උපාසක රාල කියන ගුරුතුමාට බාර දෙන්න දෙමව්පියන් තීරණය කළා. කුලතුංග දරුවා <u>නම් පොත, මඟුල් ලකුණ, සකස්කඩය</u> හා <u>නවරත්නය</u> යන පොත් පිළිබඳ තම ගුරුතුමාගෙන් හරි ආසාවෙන් ඉගෙන ගත්තා. පසුව සූරියගොඩ රාජගුරු හිමියන් යටතේ අවුරුදු සොළොස්විය වනවිට වැලිවිට සරණංකර නමින් පැවිදි වුණා.**

**ඉතින් දරුවනේ, මේ සරණංකර හිමි ජීවත්වුණු මහනුවර යුගය ලාංකීය ඉතිහාසයේ හැම පැත්තකින්ම පිරිහුණු කාල වකවානුවක්. යුරෝපීය පාලන සමයක් වූ නිසා ලාංකීය ජනතාවගේ සියලු වත්පිළිවෙත් සඳහා දැඩි බලපෑමක් එල්ලවූ යුගයක් ලෙස හඳුන්වන්න පුළුවන්. මේ පිරිහුණු කාලයට ජීවයක් එක් කිරීමට සමත් වීරයා වූයේ වැලිවිට සරණංකර හිමියන්. කුඩා කල සිටම අධ්‍යාපනයට දැක්වූ ලැදියාව හේතුවෙන් එකල සාහිත්‍යයේ නව පිටුවක් පෙරළීමට උන්වහන්සේ සමත් වුණා.**

**දැඩි බාධක මධ්‍යයේ <u>බාලාවතාරය නම් පාලි ව්‍යාකරණ පොතෙන්</u>**

කොටසක් ඉගෙන ගනු ලැබුවේ එවක සිරගතව සිටි ලෙව්කේ රාලගෙනි. පසු කලෙක පල්ලේකුඹුරේ අත්ථදස්සි හිමියන්ගේ ඇසුරෙහි මෙම කෘතිය සම්පූර්ණයෙන්ම ඉගෙන ගත්තා.

ඒ කාලයේ මහනුවර යුගයේ ජීවත්ව සිටි ගණින්නාන්සේලා සැපවත් ගෘහ ජීවිතයක් ගත කළ ආගමික කන්ඩායමක්. ඔවුන් සංඝයාගෙන් ඉටුවිය යුතු කාර්යයන් බාර ගෙන සිටි පිරිසක් ලෙස හඳුන්වන්න පුළුවන්. එබැවින් සරණංකර හිමියන් පිණ්ඩපාතික සිල්වත් භික්ෂු පරපුරක් ඇති කිරීමට මූලිකත්වය ගත්තා. පසුව එය සිල්වත් සමාගම ලෙස ප්‍රසිද්ධ විය. මෙමඟින් පරිහානියට පත් වූ සාහිත්‍ය පමණක් නොව අධ්‍යාපනය ද නගා සිටුවීමට සරණංකර හිමියන්ට හැකි වුණා.

සාරාර්ථ සංග්‍රහය, මුණි ගුණ අලංකාරය, භේසජ්ජ මංජුසා සන්නය, මහා බෝධිවංශ සන්නය, රූප මාලාව,පාලි සන්දේශය උන්වහන්සේ ලියූ ශ්‍රේෂ්ඨ කෘති කිහිපයක්. එපමණක් නොව පිරිවෙන් ආරම්භ කිරීමෙහිලා පුරෝගාමී වූ චරිතයක් ලෙස සරණංකර හිමියන් හඳුන්වන්න පුළුවන්. ඇම්බැක්ක දේවාලය අසල නියම කන්ද පිරිවන එයට කදිම නිදසුනක්. සරල දිවිපෙවතක් ගත කළ උන්වහන්සේට මෙම ධර්ම හා සාහිත්‍ය සේවාව අගය කිරීමක් වශයෙන් ශ්‍රී විජය රාජසිංහ රජතුමන්ගේ කාලයේදී එම රජු විසින් 'රාජ ගුරු'යන ගරුනාමය පුදනු ලැබුවා.

සියම් නිකායේ ආරම්භය සනිටුහන් කරමින් උපාලි තෙරණුවන් ප්‍රධාන භික්ෂූන් වහන්සේලා විසිඑක් නමක් ,මෙරටට වැඩමවීමෙන් අනතුරුව සිල්වතුන් මහණ කිරීම සහ සාමණේර හිමිවරුන් උපසම්පදා කරමින් මෙරට සසුන බැබළවීමට සමත් වුණා. මෙය සිදුවන්නේ ශ්‍රී රාජසිංහ රජ සමයේදීය. අනතුරුව මෙම රජු උන්වහන්සේට ලක්දිව 'සඟරජ' තනතුර පිරිනැමීය.

දරුවනේ ,සරණංකර හිමි සතු නිහතමානිත්වයේ උදාරබව පිළිබිඹු කරමින් 'උඩගු නොව මහණ' යනුවෙන් තුන් වරක් පන්සලේ උළුවස්සේ ලියා තැබීමට කටයුතු කළ බවට පොත පතේ සඳහන් වෙනවා. ක්‍රිස්තු වර්ෂ 1778 දී අපවත් වන සංඝරාජ හිමියන් ලාංකේය සිංහල සාහිත්‍ය හා බෞද්ධ ශාසනයේ පුනර්ජීවයේ පුරෝගාමියෙකු ලෙසද අපට හඳුන්වාදෙන්න පුළුවන්."



1) සරණංකර සංඝරාජ හිමියන්ගේ සිතුවමක්



2) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සරණංකර හිමියන්ට සංඝරාජ ධූරය පිදූ වග දැක්වෙන සිතුවමක්




3) සරණංකර හිමියන් සිහි කිරීමට මුද්‍රණය කළ මුද්දරයක්




1) සරණංකර හිමියන්ගේ උපත සිදුවූයේ කිනම් ප්‍රදේශයේදී ද?

2) උන්වහන්සේගේ ගිහි කළ පැවති නම කුමක් ද?

3) සරණංකර හිමි මූලික අධ්‍යාපනය ලැබූ ගුරුවරයාගේ නම කුමක් ද?

4) එහිදි ඉගෙන ගත් පොත් තුනක් නම් කරන්න.

5) සරණංකර හිමි බාලාවතාරය නම් පාලි ව්‍යාකරණ පොත ඉගෙන ගත්තේ කෙසේ ද?

6) මහනුවර යුගයේ (සරණංකර හිමි විසූ අවධියේ) ශ්‍රී ලංකාවට උපසම්පදාව ලැබුණු රට කුමක් ද?

7) ඒ කිනම් භික්ෂුවගේ මූලිකත්වයෙන් ද?

8) කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සරණංකර හිමියන්ට ලබා දුන් පදවිය කුමක් ද?

9) සරණංකර හිමියන් විසින් රචිත ග්‍රන්ථ මොනවාද?

10) සරණංකර හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ කීපයක් ලියා දක්වන්න.

# ➢ සමානාර්ථ පද

එකම අර්ථය සහිත පද දෙකක් හෝ ඊට වැඩි ගණනක් තිබෙන්නා වූ පද විශේෂය සමානාර්ථ පද ලෙස හැඳින්විය හැකිය. තවත් ලෙසකින් කිවහොත් යමක් පැහැදිලි කිරීමට වචන රාශියක් ඇත්නම් එම වචන හඳුන්වන පද, සමාන පද/සමානාර්ථ පද ලෙස හැඳින්වේ.

උදාහරණඃ

| පදය | | සමානාර්ථ පද |
|---|---|---|
| * වනය |  | වනාන්තරය, කැලෑව, බැද්ද, මුකලාන, අරණ |
| * මුහුද |  | සමුදුර, සයුර, සාගරය, සමුද්‍රය, සිඳු |
| * ගස |  | රුක, වෘක්ෂය, තුරු |

- ලේඛන කුසලතා වර්ධනය කරගැනීම හා වාක් කෝෂීය දැනුම වැඩිදියුණු කරගැනීමට සමානාර්ථ පද පිළිබඳ දැනුම, අවබෝධය ඉතා වැදගත් වේ.

✓ පහත සඳහන් පදවලට ගැළපෙන සමානාර්ථ පදය තෝරා යා කරන්න.

| | |
|---|---|
| ✦ පොත | පැන් |
| ✦ හිස | ස්වර්ණ |
| ✦ නිවස | පසිඳු |
| ✦ ප්‍රසිද්ධ | නිවහන |
| ✦ රත්තරන් | කෘතිය |
| ✦ වතුර | ඔළුව |

- දෙවන පාඩමේ ඇති අවබෝධය, ලිඛිත අභ්‍යාස (11-13 පිටු) කරන්න.